# 2015

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயற்பாட்டு அறிக்கை
## Annual Performance Report

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சு

Ministry of Megapolis & Western Development

**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

# *වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2015*

**17 මහල, සුහුරුපාය, සුභූතිපුර පාර, බත්තරමුල්ල**

**දුරකථන : 0112 864 770 /0112 866 447**
**ෆැක්ස් : 0112 887 909**
**විද්‍යුත් තැපැල : info@megapolismin.gov.lk**
**වෙබ් අඩවිය : www.megapolismin.gov.lk**

# මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

## ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා (පා.ම.)

**අමාත්‍ය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

## ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා (පා.ම.)

**නියෝජ්‍ය අමාත්‍ය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

**අමාත්‍යාංශයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්**

**නිහාල් රූපසිංහ මහතා**

*ලේකම්, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය*

***කේ. ඩබ්ලිව්.ටී.එන්. අමරතුංග මිය***

*අතිරේක ලේකම් (පාලන)*

**පී. සුරේෂ් මහතා**

*අතිරේක ලේකම් (නාගරික සංවර්ධන)*

**මාධව වෛද්‍යරත්න මහතා**

*අතිරේක ලේකම් (මහානගර)*

# පටුන


**1.** **මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය…………………………………………………....** **1-2**

**2.** **අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය ……………………………………………………………..……** **3**

**3.** **ආංශික කාර්යසාධනය**

3.1 පාලන අංශය ........................................................................................................ 4

3.2 ගිණුම් අංශය ........................................................................................................ 5-6

**4.** **අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතන සහ දෙපාර්තමේන්තු ………………………...** **7-8**

**5.** **අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති**

5.1 විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ...................................................... 8-9

5.2 දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති …………………...………..……….. 9-10

# 1. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

අංක 1933/13 දරණ, 2015.09.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාංශය පිහිටුවන ලදී.

**දැක්ම**

ජනතාවගේ ආර්ථික හා ආධ්‍යාත්මික යහපැවැත්ම මෙන්ම ස්වභාව ධර්මය සමග සුසංයෝගී වූ ප්‍රියමනාප දිවිපැවැත්මක් සහතික කරන තිරසර නාගරික ජීවිතයක්

**මෙහෙවර**

විශිෂ්ට නගර සැලසුම් හා ඉංජිනේරු නිපුණතා, අතිනවීන තාක්ෂණය සහ ලෝකයේ විශිෂ්ට භාවිතාවන් යොදා ගනිමින්, රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානවල මැනවින් සැලසුම් කරන ලද හරිත, පවිත්‍ර සහ සුහුරු නාගරික ජනාවාස නිර්මාණය කිරීම තුළින් දේශයේ ආර්ථික සමෘද්ධිය සාක්ෂාත් කරගැනීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

**අරමුණු**

අමාත්‍යාංශයේ මූලික අරමුණ වන්නේ ජන ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වා ගන්නා අතරම නාගරික ප්‍රදේශවල වාසය කරන ජනතාව රටේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ කොටස්කරුවන් වන බවට සහතික කරන්නා වූ විධිමත් වෙනස්කම් සහ සංවර්ධන ක්‍රියාදාමයන් නාගරික ප්‍රජාව වෙත ගෙන ඒමය. මෙමගින් ශ්‍රී ලංකාව ආසියාවේ වාණිජ, නාවික හා ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ මග සැලසෙයි.

මෙම අමාත්‍යාංශයේ මූලික වගකීම් අතරට සමස්ත ශ්‍රී ලංකාවටම අදාළ ජාතික භෞතික සැලසුම සකස් කිරීමත්, උපාය මාර්ගික හා පොදු නාගරික සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමත් ඇතුළත් වේ. එසේම මීළඟ වසර පහ තුළ සමස්ත බස්නාහිර පළාතේ පරිපූර්ණ සංවර්ධනයක් ඇති කරලීමේ අරමුණින් එය මහානගරයක් බවට පරිවර්තනය කිරීමට අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

බස්නාහිර කලාප මහානගර සංවර්ධන ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ දිගු කාලීන හා මැනවින් ප්‍රතිෂ්ඨාපිත, තිරසර අනාගත නාගරික ක්‍රියාදාමයට මග හෙළිකරන සංවර්ධන අපිකේන්ද්‍රයක් සේ ක්‍රියාකරනු ඇත. රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානයන්හි සුහුරු නාගරික ජනාවාස සැලසුම් කිරීමට අමතරව නාගරීකරණය නිසා නිර්මාණය වූ කැලිකසල, මුඩුක්කු, බලශක්තිය, රථවාහන තදබදය, පරිසරය සහ ජීවනෝපාය ආශ්‍රිතව හටගත් නිශ්චිත ගැටළු සඳහා අවශ්‍ය විසඳුම් ලබාදීමට ද වෑයම් කරනු ඇත.

**බලතල හා කාර්යයන්**

- මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ විෂයපථයට අදාල හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු, ව්‍යාවස්ථාපිත ආයතනවල විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය හා ඊට අදාල කටයුතු
- නාගරික ප්‍රදේශවල ආර්ථික, සමාජීය හා භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු දිරිගැන්වීම
- නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
- පහත් බිම් ගොඩකිරීම හා සංවර්ධනයට අදාල කටයුතු
- නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම්, පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම
- ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැලසුම් පිළියෙල කිරීම
- ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම පදනම් කරගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදු කිරීම
- අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවලට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාල කටයුතු
- අමාත්‍යාංශයේ විෂයපථයට ගැනෙන ආයතන අධීක්ෂණය කිරීම

**අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන**

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- නාගරික සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව


**අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දේශීය අරමුදල් ව්‍යාපෘති**

- කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය මහානගර ප්‍රධාන සැලසුම් ව්‍යාපෘතිය

**අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශීය අරමුදල් ව්‍යාපෘති**

- උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (මහනුවර සහ ගාල්ල)
- කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
- මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය (3K)
- කොළඹ අගනගරය ආශ්‍රිත ගංවතුර බලපෑම් අවම කිරීමේ හා නාගරික පරිසර භාර අරමුදල

## 2. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



# 3. ආංශික කාර්යසාධනය

## 3.1. පාලන අංශය

**වගකීම**

අදාල කාර්යයන් කාර්යක්ෂමව, කඩිනම්ව, ගුණාත්මකව හා අඛණ්ඩව රජයේ නීතිරීති හා චක්‍රලේඛවලට අනුකූලව ඉටු කිරීම.

**අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහ අමාත්‍ය කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ සියලුම ආයතන කටයුතු මෙන්ම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සහ ව්‍යාපෘතිවල සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු සියලුම ආයතන කටයුතු

**අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු**

| කාණ්ඩය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2015.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු/අතිරික්ත (ඇත්නම්) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 31 | 16 | 15 (පුරප්පාඩු) |
| තෘතියික | 06 | 03 | 03 (පුරප්පාඩු) |
| ද්විතීයික | 95 | 27 | 68 (පුරප්පාඩු) |
| ප්‍රාථමික | 44 | 12 | 32 (පුරප්පාඩු) |
| **එකතුව** | **176** | **58** | **118 (පුරප්පාඩු)** |

**අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්**

| කාණ්ඩය | 2015.12.31 දිනට | | | |
|---|---|---|---|---|
| | ස්ථාන මාරු වී ගිය | ස්ථාන මාරු වී පැමිණි/ නව බඳවා ගැනීම්/අමාත්‍යාංශ විෂයපථය වෙනස්වීමේ දී පෙර අමාත්‍යාංශයේ සිට ස්ථාන මාරු වී පැමිණි | විශ්‍රාම ගැනීම් | ඉල්ලා අස්වීම් |
| ජ්‍යෙෂ්ඨ | - | 16 | - | - |
| තෘතියික | - | 03 | | - |
| ද්විතීයික | - | 27 | - | - |
| ප්‍රාථමික | - | 12 | - | - |
| **එකතුව** | **-** | **58** | **-** | **-** |

**පුහුණුවීම්**

- **විදේශ පුහුණුවීම්**

| වැඩසටහන් ප්‍රමාණය | සහභාගී වූ මාණ්ඩලික නිලධාරීන් ගණන | අමාත්‍යාංශය දරා ඇති මුළු වියදම (රුපියල්) |
|---|---|---|
| 01 | 02 | 126,680 |

- **2015 - විදේශ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා දූත මණ්ඩල**

| # | නම හා තනතුර | පාඨමාලාව/වැඩසටහන | රට | කාල සීමාව |
|---|---|---|---|---|
| 1 | ඉංජි.පී. සුරේෂ් මහතා අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) | 2015 KRIHS – WBG නගර කළමනාකරණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන | කොරියාව | 2015.12.12 සිට 2015.12.20 |
| 2 | කේ.එස්. මුර මුදලිගේ මිය අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | | | |

## 3.2 ගිණුම් අංශය

**වගකීම**

අමාත්‍යාංශය සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්වී ඇති ප්‍රතිපාදන සීමාව තුළ අදාල වියදම් දැරීම, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය තත්වය පිළිබඳ ගිණුම් පිළියෙල කිරීම හා විගණනයට ඉදිරිපත් කිරීම.

**අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

1. අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල හා විදේශ ව්‍යාපෘති සම්බන්ධව වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා වාර්ෂික අයවැය මගින් වෙන් වන ප්‍රතිපාදන සීමාවන් තුළ වියදම් කළමනාකරණය කර ගනිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය කරගෙන යාමට සහය ලබා දීම.

2. පහත සඳහන් වාර්තා නියමිත කාල රාමුව තුළ මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.

| වාර්තාව | කාල රාමුව |
|---|---|
| වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම | අදාල වර්ෂය ආරම්භයේ දී |
| වාර්ෂික අක් මුදල් පත්‍රය | වර්ෂයේ වැඩ කරන පළමු දිනයේ දී |
| වාර්ෂික අක් මුදල් සැලැස්ම | වර්ෂය ආරම්භයේ දී |
| වාර්ෂික අයවැය | චක්‍රලේඛ පරිදි ඉදිරිපත් කිරීම |
| බැංකු ගිණුම් පිළිබඳ අදාල මාසික වාර්තාව | අදාල මස වාර්තාව ඊළඟ මස 15වන දිනට පෙර |
| තැන්පත් ගිණුම් පිළිබඳ කාර්තුමය වාර්තා | කාර්තුව අවසන් වී ඊළඟ මස 15 වන දිනට පෙර |
| කාර්තුමය අක් මුදල් සැසඳුම් වාර්තා | කාර්තුව අවසන් වී ඊළඟ මස 15 වන දිනට පෙර |
| වාර්ෂික අක් මුදල් ඉල්ලුම් පත්‍රය | සෑම මසකම වැඩ කරන පළමු දින |
| මාසික ගිණුම් සාරාංශ | අදාල මාසයේ ගිණුම් වාර්තා ඊළඟ මස පස්වන දිනට හෝ ඊට පෙර |

3. විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා

   i. වාර්ෂික ගිණුම් වාර්තා - අදාල වර්ෂයේ ගිණුම් වාර්තා ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර
   ii. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම - අදාල වර්ෂයේ ගිණුම් වාර්තා ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර

4. භාණ්ඩාගාරය සමග සම්බන්ධීකරණය කරමින් විදේශ ව්‍යාපෘති සඳහා හා අනිකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා අක් මුදල් ලබා ගැනීම හා එම මුදල් ව්‍යාපෘති අතර බෙදා හැරීම

5. විදේශ ව්‍යාපෘතිවල මුදල් ගෙවීම්වලට අදාල ඉල්ලුම්පත්‍ර (withdrawal application) භාණ්ඩාගාරය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම

6. මූල්‍ය කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා නියෝගවලට අනුකූලව අදාල ගෙවීම් හා ලැබීම් ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාරයට වාර්තා කිරීම

7. අමාත්‍යාංශයේ හා අදාල ආයතන හා විදේශ ව්‍යාපෘතිවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අදාල වාර්තා විගණකාධිපති හා අනිකුත් ආයතන වෙත ලබාදීම

8. කොම්ට්‍රෝලර් ජනරාල් වෙත අදාල වාර්තා සැපයීම, අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලින් යැවිය යුතු වාර්තාවල ප්‍රගතිය තහවුරු කර ගැනීම

9. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු

10. විගණන විමසුම් සඳහා අදාල අංශ සමග සම්බන්ධීකරණය කරමින් විගණකාධිපති වෙත පිළිතුරු යැවීම

## 2015.12.31 දිනට ප්‍රගතිය

2015.02.29 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2015 අංක 1 දරණ විසර්ජන (සංශෝධිත) පනත (2014 වසරේ සම්මත කරන ලද) අනුව නාගරික සංවර්ධන, ජල සැපයුම් හා ජලාපවාහන අමාත්‍යාංශය (වැය ශීර්ෂ අංක 166) යටතේ පැවති නාගරික සංවර්ධන, පහත්බිම් ගොඩකිරීම හා සංවර්ධනය සහ මහානගර සැලසුම් යන විෂයයන් 2015.11.26 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2015 අංක 15 දරණ විසර්ජන (සංශෝධිත) පනත අනුව නව වැය ශීර්ෂ අංක 162 යටතේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

2015.12.09 දිනැති අයවැය චක්‍රලේඛ අංක 5/2015 මගින් ලබා දෙන ලද උපදෙස් අනුව, පැරණි වැය ශීර්ෂ අංක 166 යටතේ වාර්තා කර තිබූ වියදම් නව වැය ශීර්ෂ අංක 162 යටතට මාරු කළ අතර, එතැන් සිට 2015.12.31 දක්වා වූ මාසකයකට ආසන්න කාලය තුළ දරණ ලද සියළු වියදම් නව වැය ශීර්ෂ අංක 162 යටතේ පහත පරිදි ගිණුම් ගත කර ඇත.

අමාත්‍යාංශය - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ශීර්ෂ අංකය - 162
කාණ්ඩය - පුද්ගල පඩිනඩි හා වෙනත් පුනරාවර්ථන වියදම්

(රු.මිලියන)

| විස්තරය | ප්‍රතිපාදන | මුළු වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|
| **අමාත්‍ය කාර්යාලය** | | | |
| පුද්ගල පඩිනඩි | 7.00 | 5.85 | 84% |
| අනිකුත් පුනරාවර්ථන වියදම් | 8.80 | 4.03 | 46% |
| මුළු එකතුව | 15.80 | 9.88 | 63% |
| **ආයතන හා පරිපාලන සේවා** | | | |
| පුද්ගල පඩිනඩි | 28.04 | 20.04 | 72% |
| අනිකුත් පුනරාවර්ථන වියදම් | 433.83 | 429.10 | 99% |
| **එකතුව** | **461.87** | **449.14** | **97%** |
| **මුළු එකතුව** | **477.67** | **459.02** | **96%** |

**ප්‍රාග්ධන වියදම්** (පුනරුත්ථාපනය හා අත්පත් කර ගැනීම්)

(රු.මිලියන)

| විස්තරය | ප්‍රතිපාදන | මුළු වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|
| **අමාත්‍ය කාර්යාලය** | | | |
| පුනරුත්ථාපනය | 8.30 | 6.36 | 76% |
| අත්පත් කර ගැනීම් | 3.80 | 1.90 | 50% |
| **මුළු එකතුව** | **12.10** | **8.26** | **68%** |
| **ආයතන හා පරිපාලන සේවා** | | | |
| පුනරුත්ථාපනය | 10.00 | 9.13 | 91% |
| අත්පත් කර ගැනීම් | 11.20 | 9.24 | 82% |
| **එකතුව** | **21.20** | **18.37** | **87 %** |
| **මුළු එකතුව** | **33.30** | **26.63** | **80%** |

**නාගරික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වියදම**

(රු.මිලියන)

| විස්තරය | | ප්‍රතිපාදන | මුළු වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරිය | | 1,158.00 | 1,070.64 | 92 % |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | | 1,300.00 | 1,278.99 | 98 % |
| කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | ලෝක බැංකුව | 5,300.00 | 2,343.83 | 44 % |
| | ශ්‍රී ලංකා රජය | 1,800.00 | 465.91 | 26 % |
| කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (3K) | ජයිකා | 919.00 | 917.75 | 99.9% |
| | ශ්‍රී ලංකා රජය | 234.00 | 97.50 | 42 % |
| හතරලියද්ද නගර සංවර්ධන ව්‍යාපෘතිය | | 55.00 | 3.79 | 7% |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (ගාල්ල හා මහනුවර) | ලෝක බැංකුව | 3,450.00 | 442.37 | 13 % |
| | ශ්‍රී ලංකා රජය | 960.00 | 91.03 | 9 % |
| මහ කොළඹ ගංවතුර වැළැක්වීම හා පරිසර සංවර්ධන ව්‍යාපෘතිය | | 100.00 | 27.12 | 27 % |
| කොළඹ අගනගරය ආශ්‍රිත ගංවතුර පාලනය සඳහා වූ නාගරික පරිසර භාර අරමුදල | | 23.00 | 12.43 | 54 % |
| කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | | 2,000.00 | 0.19 | 0.01 % |
| බස්නාහිර කලාපීය මහානගර ප්‍රධාන සැලැස්ම | | 56.15 | 50.70 | 90 % |
| මට්ටක්කුලිය සුභසාධන මධ්‍යස්ථානය | | 150.00 | 150.00 | 100 % |
| **එකතුව** | | **17,505.15** | **6,952.24** | **40 %** |

# 4 අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතන සහ දෙපාර්තමේන්තු

- **ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**

1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත මගින් පිහිටුවනලද නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව වරින් වර සිදු කරන ලද සංශෝධන හා 2000 අංක 49 දරණ සංශෝධිත පනතින් ලබා දී ඇති විශේෂ බලතල අනුව වඩාත් පුළුල් විෂය පථයක් සහිතව වර්තමාන ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස ක්‍රියාත්මකවේ.

ශ්‍රී ලංකා භූමියෙහි ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික අංශයන් හි ඒකාබද්ධ සැලසුම්කරණය ප්‍රවර්ධනය කිරීම, (නියමානුකූල පරමාර්ථය සහිතව ජාතික භෞතික සැලසුමක් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම) ස්වභාව සෞන්දර්යයෙන් යුත් ස්ථාන හා පරිශ්‍ර නගර නිර්මාණ ශිල්පීය වශයෙන් හා ඓතිහාසික වශයෙන් වැදගත්වන ගොඩනැගිලි යනාදිය සංරක්ෂණය කිරීම හා එබඳු සැලසුම් සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම පිණිස පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව මෙම ආයතනය ක්‍රියාත්මක වෙයි.

මේ යටතේ, කුඩා නගර සඳහා සැලසුම් 25ක් සකස් කිරීම හා ඊට අදාළ පළාත් පාලන ආයතනවල අනුමැතිය ලබා ගැනීම, කතරගම අභිනවාරාමයෙහි ගොඩනැගිලි සැලසුම් නිර්මාණය, අනුරාධපුර ලෝවාමහපායෙහි ගොඩනැගිලි සැලසුම් සකස් කිරීම ආදිය අවසන් කර ඇති අතර ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම යාවත්කාලීන කිරීම, හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 87ක් සඳහා විකල්ප ජනාවාස සැලසුම් කිරීම හා තෝරාගත් පූජා භූමි සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම ආදිය සිදු කෙරෙමින් පවතී.

- **නාගරික සංවර්ධන අධිකාරිය**

ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රදේශවල ආර්ථික, සමාජ හා භෞතික සංවර්ධනය දිරිගැන්වීම සඳහා 1978 අංක 41 දරණ පාර්ලිමේන්තු පනතින් නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබ ඇත.

නාගරීකරණය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව කලින්කල "නාගරික සංවර්ධන ප්‍රදේශ" ප්‍රකාශයට පත් කිරීමට 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත මගින් නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාට බලය පැවරී ඇත. පසුගිය අවුරුදු 37ක කාලය තුළ නාගරික ප්‍රදේශ 253ක් සංවර්ධනය සඳහා සුදුසු ප්‍රදේශ ලෙස හඳුනාගෙන ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

**ප්‍රගතිය - 2015**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් පළාත් 9තුළ පහත පරිදි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

| # | පළාත | භාණ්ඩාගාර අරමුදලින් කළ ව්‍යාපෘති | නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදලින් | වෙනත් මූල්‍යමය මූලාශ්‍ර යටතේ | මුළු ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර | 04 | 10 | 06 | 20 |
| 2 | දකුණු | 04 | 09 | 05 | 18 |
| 3 | මධ්‍යම | 09 | 07 | 04 | 20 |
| 4 | සබරගමුව | 03 | 06 | - | 09 |
| 5 | ඌව | 02 | - | 02 | 04 |
| 6 | උතුරු මැද | 01 | 06 | - | 07 |
| 7 | වයඹ | 01 | 01 | 02 | 04 |
| 8 | නැගෙනහිර | 01 | 03 | 07 | 11 |
| 9 | උතුර | 04 | 07 | - | 11 |

- **ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව**

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනු 1976 අංක 27 දරණ පනතින් ද 1982 අංක 52 දරණ පනතින් ද 2006 අංක 35 දරණ පනතින් ද සංශෝධිත, 1968 අංක 15 දරණ කොළඹ දිස්ත්‍රික් (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද සංස්ථාපිත මණ්ඩලයකි.

මේ යටතේ, ඇළ මාර්ග නඩත්තු කිරීම, ජල ගැලීම් පාලනය කිරීම, තෙත්බිම් කළමනාකරණය, ඉදිකිරීම් ව්‍යාපෘති, මුහුදුවැලි විකිනීමේ ව්‍යාපෘතිය, ඉඩම් සංවර්ධනය සහ රක්ෂිත ඇළ මාර්ග සඳහා අනුමැති නිකුත් කිරීම, ඉංජිනේරුමය ද්‍රව්‍ය පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ සිදු කිරීම, උපදේශක සේවා සැපයීම ආදිය සිදු කරනු ලබයි. එමෙන්ම, විශේෂ ව්‍යාපෘති, වේරස් ගඟ වැසි ජල අපවහන සහ පාරිසරික ප්‍රවර්ධන ව්‍යාපෘතිය, කළු ඔය වැසි ජල අපවහන සහ පරිසර ප්‍රවර්ධන ව්‍යාපෘතිය සහ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ජලාපවහන අධ්‍යයනය ආදිය ද සිදු කෙරේ.

## 5. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති

### 5.1 විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- **කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (2012 - 2017)**

කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොළඹ නගරය හා ඒ අවට නාගරික ප්‍රදේශ නැවත ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා රජය, පුනරුත්ථාපනය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුවේ අනුග්‍රාහකත්වයෙන් මූල්‍ය පහසුකම් ලබා ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය පහත දැක්වෙන අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මහ කොළඹ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරීමේ රජයේ දිගුකාලීන වැඩසටහනට ඉක්මන් හා කාලීන සහයක් ලබාදීමට කටයුතු කරයි.

- අගනගර ප්‍රදේශය ජලයෙන් යට වීම නිසා සිදුවන භෞතික හා සමාජ බලපෑම් අඩු කිරීමේ අරමුණින් ඉහළම මූලිකත්වයක් දෙමින් නාගරික ආයෝජන සිදු කිරීම

- ප්‍රාදේශීය යටිතල පහසුකම් සහ සේවා සැපයීම මෙන්ම පළාත් පාලන ආයතනවල හැකියාවන් දිගුකාලීන ලෙස වර්ධනය කිරීම හා පහත දැක්වෙන අංශ සඳහා ක්‍රියාත්මක කිරීමේ සහය ලබාදීම
  - ජල ගැලීම් හා අපවහන පද්ධති කළමනාකරණය
  - නාගරික සංවර්ධනය, යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා ධාරිතා ප්‍රවර්ධනය

ව්‍යාපෘතිය පහත දැක්වෙන පරිදි කොටස් 03කින් සමන්විත වේ.

1. පළමු කොටස - ජල ගැලීම් හා අපවහන පද්ධති කළමනාකරණය
2. දෙවන කොටස - යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා කොළඹ නගරය ආශ්‍රිත පළාත් පාලන ආයතනවල ධාරිතා සංවර්ධනය
3. තෙවන කොටස - ක්‍රියාත්මක කිරීමේ සහාය

- **උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (2014 - 2019)**

නගර සංවර්ධන වැඩසටහන් යටතේ උපාය මාර්ගික නගර 02ක් එනම් මහනුවර හා ගාල්ල යන නගර සංවර්ධනය කිරීම සඳහා ලෝක බැංකුව මූල්‍යාධාර සපයනු ලබයි. නගර කලාප තුළ එම නාගරික සේවා සහ පොදු නාගරික පහසුකම් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මේ යටතේ ප්‍රවාහනය හා නාගරික කටයුතු යන අංශ සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.
ඉදිරියේ දී සංවර්ධනය කිරීමට අපේක්ෂිත නගර ලෙස යාපනය හා අනුරාධපුර නගර තෝරාගෙන ඇත. ඒ අනුව යාපනය නගර සංවර්ධනය යටතේ එහි නාගරික වැඩිදියුණු කිරීම්, සංස්කෘතික උරුමයන්, ප්‍රවාහනය, අපවහන පද්ධති, වාරිමාර්ග හා ජලාශ යන අංශයන් හි සංවර්ධනය අපේක්ෂා කරනු ලබන අතර මෙම ව්‍යාපෘති යෝජනාව ඇගයීමේ කටයුතු ලෝක බැංකුව විසින් සිදු කෙරෙමින් පවතී. අනුරාධපුර නගර සංවර්ධනය යටතේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන්, අපවහන කළමනාකරණය, නාගරික ප්‍රවාහනය යන අංශ සංවර්ධනය කිරීමට අපේක්ෂිත අතර මෙම යෝජනාව සඳහා ද ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනයේ අනුමැතිය අපේක්ෂිතය.

- **මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය (2009 - 2015)**

මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය හෙවත් පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ මූල්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වේ. වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වන ජපාන බැංකුව (JBIC) අතර 2007 වසරේ මාර්තු 28 වන දින ඇති කර ගත් ණය ගිවිසුමකට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සැපයේ.

මෙම ව්‍යාපෘතිය තුළින් පිටත වටරවුම් අධිවේගී මාර්ග පද්ධතියට පිටිවහලක් ලෙස කඩුවෙල ප්‍රදේශයේ මාර්ග දෙකක් සංවර්ධනය කර ඇති අතර, පන්නිපිටිය -කොට්ටාව මාර්ගය ප්‍රතිසංස්කරණය හා මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම යන ව්‍යාපෘති ද සිදු කෙරෙමින් පවතී. 2016 වර්ෂයේදී කොට්ටාව - මාලබේ මාර්ගයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට ද අපේක්ෂා කෙරේ.

## 5.2 දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- **බස්නාහිර කලාපීය මහානගර ප්‍රධාන සැලසුම් ව්‍යාපෘතිය (2015 - 2017)**

සමාජ, සංස්කෘතික ඒකාග්‍රතාවය තහවුරු කරමින් පාරිසරික තිරසරභාවය හා ගෘහ ආර්ථික සංවර්ධනය මත පදනම් වූ සහ තාක්ෂණික වශයෙන් වැඩිදියුණු වූ තොරතුරු තාක්ෂණය, ප්‍රවාහනය, සන්නිවේදනය හා බලශක්තිය යන අංශයන්හි වඩාත්ම ක්‍රියාශීලී හා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ව්‍යාපාර සංවර්ධනය හා උසස් කාර්මික පහසුකම් සහිත ජීවත්වීමට සුදුසු නගරය බවට බස්නාහිර පළාත පත් කිරීමේ දැක්මෙන් යුතුව 2015 මැයි 05 දින මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සහ සිංගප්පූරුවේ Surbana/CESM සමාගම අතර 2015 සැප්තැම්බර් 18 වන දින මෙහි සේවා ගිවිසුම අත්සන් කරන ලදී. එහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි. 66.5 වන අතර ව්‍යාපෘති කාලය 2015.09.05 දින සිට තවත් මාස 05කින් දීර්ඝ කර ඇත.

- **කොළඹ අගනගරය ආශ්‍රිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය (2015-2017)**

මූලික වශයෙන් හඳුනා ගන්නා ලද අක්කර 200ක වපසරියකින් යුත් භූමිය, නැගුණු මහජන විරෝධය හේතුවෙන් (විශේෂයෙන් ධීවර ප්‍රජාව හා වනජීවී දෙපාර්තමේන්තුව වෙතින්) අත්හැර දමා ඇත. කෙසේ වෙතත්, වනජීවී ආරක්ෂිත කලාපයට පරිබාහිරව නව ප්‍රදේශයක් මේ සඳහා හඳුනාගනු ලැබ ඇත. මෙකී භූමිය තුළ ගොඩකරනු ලබන භූමි කොටස සඳහා පාරිසරික බලපෑම් ඇගයුම් වාර්තාව ලබාගන්නා ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් දන්වනු ලැබ ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකස් කරන ලද කාර්ය දර්ශකයට අනුකූලව මෙම පාරිසරික බලපෑම් ඇගයුම් වාර්තාවේ අධ්‍යයනයන් සිදු වෙමින් පවතී. භූලක්ෂණ සමීක්ෂණ, භූතාක්ෂණික අධ්‍යයනයන් හා සංකල්පීය ඉංජිනේරුමය සැලසුම් සඳහා ගිවිසුම්වලට එළඹීමට නියමිතය. පාරිසරික බලපෑම් ඇගයුම් අධ්‍යයනය යටතේ අපවිත්‍ර කාරක ද්‍රව්‍ය පසේ මතුපිට ව්‍යුහය මත ක්ෂීරණයවී ශ්‍රාවයක් ලෙස ගලායාම පිළිබඳව සියාම් සිමෙන්ති පුද්ගලික සමාගම විසින් කරුණු අවධාරණය කර ඇත. භාණ්ඩාගාරය මගින් මේවන විටත් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කොට ඇත. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතියට මූල්‍යාධාර සැපයීම සඳහා ලෝක බැංකුවද කැමැත්ත පළ කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත දෛනික නාගරික ඝණ අපද්‍රව්‍ය සැකසුම් කටයුතුවල ධාරිතාවය මෙට්‍රික් ටොන් 1,200කි.

- **කොළඹ අගනගරය ආශ්‍රිත ගංවතුර බලපෑම් අවමකිරීමේ හා නාගරික පරිසර භාර අරමුදල (2015-2017)**

රජයේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් කොළඹ අගනගරය ආශ්‍රිත ප්‍රදේශය ගංවතුර බලපෑම්වලින් තොර පරිසරයක් වශයෙන් සහතික කිරීම සඳහා මෙම ආධාර මුදල ලබා දී ඇති අතර එහි කාලය දීර්ඝ කිරීමට ද යෝජනා කර ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් කොළඹ අගනගරය ආශ්‍රිත කලාපයේ ආයෝජන සඳහා සහාය ලබා දෙන අතර එය පහත දැක්වෙන පරිදි සංරචක තුනකින් සමන්විතය.

**පළමුවන සංරචකය:** කොළඹ අගනගරයේ ඒකාබද්ධ ගංවතුර අවදානම් ඇගයුම

(අ) නාගරික ගංවතුර අවදානම කෙරෙහි බලපාන්නා වූ උවදුරු, නිරාවරණය වීම හා අවදානමට භාජනය වීමේ හැකියාව යන ක්ෂේත්‍ර තුන ආවරණය කරමින් කොළඹ අගනගරය ආශ්‍රිත කලාපයේ ඒකාබද්ධ ඇගයුමක් සිදු කිරීම

(ආ) කොළඹ අගනගරය ගංවතුර අවදානමට භාජනය වීම සඳහා බලපාන භෞතික, සාමාජීය, ආර්ථික හා ආයතනික මානයන් ඒකාබද්ධ කිරීම සඳහා බහු ආංශික ප්‍රවේශයක් සකස් කිරීම

(ඇ) ප්‍රධාන කේන්ද්‍රීය ආයතන, පළාත් පාලන ආයතන නිළධාරීන් හා අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන්ගේ තාක්ෂණික හැකියාව සංවර්ධනය කිරීම සඳහා පුහුණු මොඩියුලයක් සකස් කිරීම

**දෙවන සංරචකය: කොළඹ අගනගරයේ ගංවතුර අවදානම අවම කිරීමේ උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම්**

(අ) ඒකාබද්ධ අවදානම් ඇගයුමෙහි ප්‍රතිඵල පදනම් කර ගනිමින් ගංවතුර අවදානම අවම කිරීමේ උපායමාර්ග සකස් කිරීම

(ආ) සංවර්ධන සැලසුම්වල දී ගංවතුර අවදානම අවම කිරීමේ වැදගත්කම අන්තර්ගත කරමින් පුහුණු වැඩසටහන් සකස් කිරීම

**තෙවන සංරචකය:** අධීක්ෂණය හා ඇගයුම

මේ යටතේ ව්‍යාපෘතිය සඳහා නියාමන හා ඇගයුම් පද්ධතියක් සකස් කිරීම හා ද්විවාර්ෂික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම සිදුවේ.